**යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (ඉරණමඩු සංරචකය) – 2015**

---

යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ -ඉරණමඩු සංරචකය 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 පෙබරවාරි 08 දින එළඹි අංක 2711-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 2 වගවස්ථාවේ II ආ වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඉරණමඩු සංරචකය සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘතියේ ඉරණමඩු සංරචකය ව්‍යාපෘතියේ ඉරණමඩු සංරචකය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉරණමඩුකුලම් වඩා ශක්තිමත් කිරීම හා විශාල කිරීමෙන් එහි ජල රැඳවීම් ධාරිතාවය වැඩි කිරීම සහ වැඩි කරන ලද ජල රැඳවුමෙන් යාපනය අර්ධද්වීපයේ ජල සම්පාදන ව්‍යාපෘතියට මාසිකව අක්කර අඩි 660 ක් මුදාහැරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඉරණමඩු සංරචකයේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,198.3 කට සමාන එජඩො මිලියන 16.91 ක් වූ අතර ඉන් රු.මිලියන 1,753.7 කට සමාන එජඩො මිලියන 13.49 ක් හෙවත් මුළු පිරිවැයෙන් සියයට 79 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 මැයි 06 දින ආරම්භ කරන ලද අතර 2017 අගෝස්තු 14 වන විට නිම කිරීමට නියමිතය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.5 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත

සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1** **මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------**

**2.2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට නිම නොකර පැවතුණු සිවිල් වැඩ පිළිබඳ කොන්ත්‍රාත් 03 ක් යටතේ එකතුව රු.මිලියන 167.22 ක්වූ වැඩ වටිනාකම කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) ලැබුණු අරමුදල්වල සමුච්චිත ප්‍රමාණය හා 2015 දෙසැම්බර් 31 දිනට ඒ පිළිබඳ දරන ලද වියදම් දක්වනු වෙනුවට ලැබුණු අරමුදල් හා සමාලෝචිත වර්ෂය තුළ දරන ලද වියදම් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2015 දෙසැම්බර් 31 දිනට ලැබුණු අරමුදල් හා ඒ පිළිබඳ දරන ලද වියදම රු.මිලියන 42.71 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 13.49 | 1,753.70 | 172 | 0.97 | 135.56 | 1.31 | 178.26 |
| ශ්‍රී ලං ර | 3.42 | 444.60 | 50 | 0.32 | 41.63 | 0.32 | 41.64 |
| | 16.91 | 2,198.30 | 222 | 1.29 | 177.19 | 1.63 | 219.90 |

ලැබුණු තොරතුරු අනුව, ජල සම්පත් බෙදාගැනීම මත ඉරණමඩු ප්‍රදේශයේ ගොවීන්ගෙන් එල්ල වූ දැඩි විරෝධය හේතුවෙන් ව්‍යාපෘති කාර්යයන් අත්හිටුවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 2,198.30 කට සමාන එජඩො මිලියන 16.91 ක් වූ මුළු වෙන්කිරීමෙන් රු.මිලියන 219.90 කට සමාන එජඩො මිලියන 1.63 ක මුදලක් පමණක් ව්‍යාපෘති කාර්යයන් ආරම්භ වී වර්ෂ 04 ක් හා මාස 08 ක් ඉකුත් වීමෙන් පසුව 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත සඳහන් පරිදි, යාපනය අර්ධද්වීපය සඳහා ප්‍රධාන ජල ප්‍රභවයක් ලෙස ඉරණමඩු ජලාශය භාවිතා කිරීම සඳහා ඉරණමඩු ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ විරෝධතා හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු 2014 වර්ෂයේදී අත්හිටුවා තිබුණි. කෙසේ වුවද 2015 ජූලි 15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී යාපනය අර්ධද්වීපයේ ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා මුහුදු ජලයේ ලුණු ඉවත් කිරීම සඳහා ව්‍යාපෘතියේ කාර්යයන් වෙනස් කර තිබුණි. එබැවින් ව්‍යාපෘති කටයුතු 2015 පෙබරවාරි මාසයේදී නැවත ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතියේ වැඩ විෂය පථයේ කරන ලද ව්‍යුහාත්මක වෙනස්කම් සැලකීමෙන් තොරව වේළි බැම්, පිටාර මඟ හා තාප්ප බිත්ති, රළපනාවේ ආරක්ෂණ වැඩ, නව රේඩියල් ගේට්ටු සැපයීම සහ සවිකිරීම,

පිටාර මහ හා ස්ලුයිස් ගේට්ටු ස්වයංක්‍රීයතාවය ආදිය පිළිබඳ පුනරුත්ථාපන කාර්යයන් මත පැකේජ 03 ක් යටතේ සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ වැඩ පිළිබඳ විෂය පථය ප්‍රති ව්‍යුහගත කර තිබුණද ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගැනීම සඳහා වගකීම් දක්වමින් ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක ඇතුළත් කර පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද ව්‍යාපෘතිය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.1 හා 4.2.2 ඡේදවලින් නියම කර ඇති පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා කාල උපලේඛනයක් පිළියෙල කර නොතිබුණි.